# ලංසු සඳහා ආරාධනාවයි
## ප්‍රාදේශීය ලේකම් කායර්ාලය, උඩපළාත

1. උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල ආපදා නිවාස වැඩසටහන (2025) යටතේ පාරදෙක වසමේ සොගම වත්තේ නිවාස 14 ක් ඉදිකිරීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම්/ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්ලත් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන CIDA ලියාපදිංචි සහතික C6 හෝ ඉහළ (ගොඩනැගිලි) යටතේ ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසු විස්තර සහ වැඩිදුර තොරතුරු www.udapalatha. ds.gov.lk වෙබ් අඩවියේ ''ප්‍රසම්පාදන'' තීරුව මඟින් ලබාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා ආපසු නොගෙවන රු.6,000.00 ක මුදල ගෙවා 2025.10.13 දින සිට 2025.10.27 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු ලියවිලි ලබාගත හැක.

3. නිසි පරිදි සම්පූණර් කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස්කර අවශ්‍ය ඇමුණුම් සමඟ මුල් පිටපත් හා අනු පිටපත් වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා කවරයේ ඉහල වම් කෙලවරේ ''උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාරදෙක වසමේ සොගම වත්තේ නිවාස 14 ක් ඉදිකිරීම'' යන්න සඳහන් කර 2025.10.28 වන දින ප.ව. 2.00 හෝ ඊට පෙර ලැබෙන සේ ප්‍රාදේශීය ලේකම් හා ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ප්‍රාදේශීය ලේකම් කායර්ාලය, උඩපළාත, ගම්පොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කායර්ාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකල හැකිය.

4. ප්‍රමාද වී ලැබෙන, නියමිත ආකෘති හා උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලද ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර විකල්ප ලංසුපත් භාරගැනීම සිදුකරනු නොලැබේ.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවලින් පමණක් ලබාගත් රු. 392,000.00 ක් වටිනා 2026.02.24 දින දක්වා වලංගු වන පරිදි උඩපළාත ප්‍රාදේශීය ලේකම් නමින් ලබාගත් කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ සරප් වෙත මුදලින් ගෙවන ලද ලදුපත ලංසු සමඟ ඉදිරිපත් කල යුතුය. බැංකු මඟින් ලබාගන්නා ලංසු සුරක්ෂණ ''ප්‍රාදේශීය ලේකම්'' උඩපළාත නමින් ලබාගෙන තිබීම අත්‍යාවශ්‍යය වේ.

6. ලංසු ලියවිලි වල ඉල්ලා ඇති තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කල පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කල යුතුය.

7. ලංසු ඉදිරිපත් කිරීමට පෙර පරීක්ෂා කිරීමේ ලැයිස්තුව (Check list) සමඟ තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂාකර ඉදිරිපත් කිරීම සුදුසු වේ.

8. 2024 නව ප්‍රසම්පාදන මාගෙර්පදේශ සංග්‍රහයට අනුව ලංසු ඇගයීම් කටයුතු ලංසු ඇගයීම් කමිටුව (BEC) විසින් සිදුකරනු ලැබේ.

9. ලංසුකරුවන් තෝරා ගැනීමේදී මීට පෙර කර ඇති සාර්ථක ඉදිකිරීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමඟ ඉදිරිපත් කල යුතුය.

10. ලංසුවට අදාල වැඩිමනක් විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ දුරකථන අංක 081- 2351352 මඟින් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ ගණකාධිකාරී අමතා ලබාගත හැකිය.

11. ලංසු භාරගැනීමේ කටයුතු 2025.10.28 වන දින ප.ව. 2.00 ට අවසන් කරන අතර එදිනම ප.ව. 2.10 ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

12. ලද ලංසු අතර යෝග්‍ය ලංසුපත් පිළිගැනීම හෝ අසම්පූණර්ව ඉදිරිපත් කර ඇති ලංසුපත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

## උපලේඛනය

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.) | ලංසු සුරක්ෂණයේ වලංගු කාලය | අවම යෝග්‍යතාවය CIDA | ලංසු ලියවිලි ගාස්තු (රු.) | නිම කල යුතු කාලය |
|---|---|---|---|---|---|---|
| උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාරදෙක වසමේ සොගම නිවාස 14 ක් ඉදිකිරීම | 39.2 | 392000.00 | 2026.02.24 | C6 හෝ ඉහළ (ගොඩනැගිලි) | 6,000.00 | සති 30 |

ආත්මා දිලුක්ෂි ජයරත්න
ප්‍රසම්පාදන කමිටු සභාපති,
ප්‍රාදේශීය ලේකම්,උඩපළාත